# හැෂ් එක (Torrentt Hash) භාවිතා කරමින් ටොරන්ට් ෆයිල් භාගත කරගන්නා ආකාරය.

ටොරන්ට් භාවිතයෙන් චිත්‍රපට ඇතුළු විවිධ ගොනු භාගත කරගැනීම අද වන විට ඉතා ජනප්‍රිය වී ඇති බව රහසක් නොවේ. නමුත් සමහර අවස්ථාවලදී ටොරන්ට් ෆයිල් එක සොයා ගැනීමට තරමක් අපහසු වන බව අත්දැකීමෙන් මා දන්නවා. මෙයට විසඳුමක් අන්තර්ජාලයේ සොයමින් සිටින විට මෙම අපූරු ක්‍රමය සොයාගත හැකි වූ අතර බයිස්කෝප් වෙබ් අඩවියේ http://www.baiscopelk.com/ සියලු සාමාජිකයන් සමඟ මෙය බෙදා ගැනීමේ අරමුණින් තමයි මෙම ලිපිය සකස් කරන්නේ.

ටොරන්ට් ෆයිල් එකට අදාළ හැෂ් එක පිලිබඳව සියලු දෙනාම දන්නවා යැයි සිතනවා. අප බොහෝ දෙනෙක් කරන්නේ මෙම හැෂ් එක කොපි කර ගූගල් සෙවුමක් සිදුකරමින් අපට අවශ්‍ය ටොරන්ට් ෆයිල් එක සොයා එය ටොරන්ට් ක්ලයන්ට් මෘදුකාංගය (u-torrent, bit-torrent etc..) හරහා විවෘත කිරීමයි. නමුත් සමහර අවස්ථාවලදී අපට මෙම ටොරන්ට් ෆයිල් එක සොයා ගැනීමට නොහැකි වන අතර එමනිසා අදාල චිත්‍රපටය හෝ අපට අවශ්‍ය ගොනුව භාගත කර ගැනීමේ අදහස අත්හැර දැමීමට සිදුවේ. නමුත් එවන් අවස්ථාවලදී අපට ටොරන්ට් ෆයිල් එකට අදාළ **හැෂ්** (HASH) එක සොයා ගැනීමට අපහසු නොවේ. බයිස්කෝප් සිංහලෙන් වෙබ් අඩවියේනම් ඒක ලබා දෙනවා.

ටොරන්ට් ෆයිල් එක සොයා ගැනීමට අපහසු අවස්ථාවලදී පහත ක්‍රමය අනුගමනය කරන්න.

## ටොරන්ට් ෆයිල් එක සොයා ගැනීමට අපහසු වූ අවස්ථාවක්




ටොරන්ට් ෆයිල් එක සොයා ගැනීමට නොමැති අවස්ථාවකදී ඇඩ්‍රස් බාර් එක මත නිල් පාටින් ලකුණු කර ඇත්තේ ටොරන්ට් හැෂ් එක වේ.

## දැන් ටොරන්ට් භාගත කරන මෘදුකාංගය විවෘත කරගන්න




රතු පාටින් දක්වා ඇති ස්ථානයේ ක්ලික් කළ විට ලැබෙන බොක්ස් එක මත පහත කෝඩ් එක යතුරුලියනය (Type) කරන්න. නැතිනම් කොපි කර පේස්ට් (Copy - Paste) කරන්න.

magnet:?xt=urn:btih:

දැන් බයිස්කෝප් සිංහලෙන් වෙබ් අඩවියේ ලබා දී ඇති හෑෂ් එක ද කොපි කරගන්න. නැතිනම් ඇඩ්‍රස් බාර් එකෙන් හෑෂ් එක සොයා ගන්න. පහත ආකාරයට ටයිප් කළ කෝඩ් එකට ඉදිරියෙන් හෑෂ් එක පේස්ට් කරන්න. (මෙහිදී ස්පේස් තැබීමෙන් වළකින්න.) දැන් OK කරන්න.

magnet:?xt=urn:btih:73BAC0F3D5BF18FDC77A82D97362B9E1C902C393




**හින්දි, දමිළ, ඉංග්‍රීසි ඇතුළු ඕනෑම චිත්‍රපටයක් සඳහා සිංහල උපසිරැසි ලබා ගැනීමට පැමිණෙන්න**

http://www.baiscopelk.com

*සැකසුම - චින්තක බණ්ඩාර විසිනි.*